# <u>නිවේදනය</u> B

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද **"පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන)"** නමැති පනත් කෙටුම්පත පිළිබඳ නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

ඉහත පනත් කෙටුම්පතට අදාළව අධිකරණය හමුවේ ගොනු කළ පෙත්සම සම්බන්ධයෙන් තවදුරටත් අධිකරණමය ක්‍රියාමාර්ගය පවත්වාගෙන යාමට බලාපොරොත්තු නොවන බව පෙත්සම්කරු විසින් දන්වා ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය දන්වා ඇත.

එමෙන්ම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනනුකූල නොවන බවට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම පිළිබඳ 12(4) ව්‍යවස්ථාවට අදාළ විධිවිධානවලට සහයෝගය දක්වන බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරමි.